**නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතිය (ග්‍රාමීය ජල සංරචකය) - 2013**

----------------------------------------------------------------------------------------------

නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2010 මාර්තු 26 දින එළඹි අංක එස්එල්පී 98 දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4.08(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

----------------------------------------------------------------------------------

නැගෙනහිර පළාත් ජල සම්පාදන සංවර්ධන ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, නැගෙනහිර පළාත් සභාව ව්‍යාපෘතියේ ග්‍රාමීය ජල සංරචකය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. නැගෙනහිර පළාතේ ජල සම්පාදන පහසුකම් ඉදිකිරීම හා ව්‍යාප්ත කිරීම මගින් ආරක්ෂිත පානීය ජලය සැපයීම සහ එමගින් ප්‍රදේශයේ ජීවන තත්ත්වය නගා සිටුවීමට හා දිළිඳුකම දුරලීම සඳහා දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපන් යෙන් මිලියන 6,504 වේ. එයින් ජපන් යෙන් මිලියන 4,904 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය විසින් මූල්‍යයනය කළ යුතු අතර ඉතිරි පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කළ යුතුය. කෙසේ වුවද ජපන් යෙන් මිලියන 924 ක් පමණක් මෙම සංරචකය සඳහා වෙන්කර තිබුණි. එයින් ජපන් යෙන් මිලියන 764 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යයනය කළ යුතු අතර ඉතිරි පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කළ යුතුය. 2010 මාර්තු 26 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2013 දෙසැම්බර් 31 වනවිට නිම කිරීමට නියමිතව තිබුණි. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2014 ජූලි 31 දක්වා දීර්ඝ කරන ලදි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

--------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි

විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) විශේෂ යෙන් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**
**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ යෙන් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව, 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශනවලට සහ විගණනයට ලබා ගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.488,715,310 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,027,670,755 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| සංරචක | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 399,623,857 | 334,710,045 | 734,333,902 |
| උපදේශක සේවා | 35,068,943 | 38,203,167 | 137,877,649 |
| මෝටර් වාහන | - | - | 6,384,000 |
| පරිපාලන පිරිවැය | 21,843,705 | 17,197,370 | 55,653,990 |
| බදු | 32,178,805 | 34,359,379 | 74,290,849 |

| | | | |
|---|---|---|---|
| බැඳීම් ගාස්තු | - | 7,156,048 | 14,952,848 |
| පොලී | - | 4,091,808 | 4,177,517 |
| | -------------- | --------------- | ----------------- |
| එකතුව | 488,715,310 | 435,717,817 | 1,027,670,755 |

**4.2 විශේෂ යෙන් ගිණුම**

මූල්‍ය ප්‍රකාශනවලට හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශේෂ යෙන් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට ගිණුමේ පවතින ශේෂය පහත දැක්වේ.

| | **ජපන් යෙන්** | **රු.** |
|---|---|---|
| | --------- | ----- |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 65,375,658 | 96,749,436 |
| එකතුකළා:- | | |
| ඌන පුරණයන් | 244,102,654 | 322,472,734 |
| | ---------------- | -------------- |
| | 309,478,312 | 419,222,170 |
| අඩුකළා :- | | |
| ආපසු ගැනීම් | 303,575,200 | 400,999,993 |
| විදේශ විනිමය පාඩුව | - | 10,867,490 |
| | -------------- | ---------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,903,112 | 7,354,687 |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

කොන්ත්‍රාත්කරුවන් විසින් නිම කරන ලද වැඩ සඳහා ඉදිරිපත් කරන ලද බිල්පත්‍රවලින් රඳවා ගැනීම් මුදල් ලෙස අයකර ගන්නා ලද රු.39,729,469 ක් ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සිවිල් වැඩ මුළු වටිනාකම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

**6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**6.1 අරමුදල් උපයෝජනය**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පහත දැක්වේ.

| **ප්‍රභවය** | **මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල** | | **2013 වර්ෂික අයවැයෙහි කරන ලද වෙන්කිරීම** | **සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල** | **2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල** |
|---|---|---|---|---|---|
| ---------------- | ---------------------------------- | | --------------- | --------------- | ----------------- |
| | **ජපන් යෙන්** | **රු.** | **රු.** | **රු.** | **රු.** |
| ජජාසනි | 764,000,000 | 972,010,178 | 493,500,000 | 434,692,800 | 878,595,551 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රීලංර | 160,000,000 | 203,562,340 | 91,200,000 | 54,022,510 | 149,075,204 |
| | ------------- | ---------------- | -------------- | ------------- | ---------------- |
| එකතුව | 924,000,000 | 1,175,572,518 | 584,700,000 | 488,715,310 | 1,027,670,755 |

**6.2 භෞතික කාර්ය සාධනය**

**6.2.1 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) ජල නල සැපයීම හා එළීම**

මඩකලපුව දිස්ත්‍රික්කයේ කොක්කඩිචෝලෙයි හා පොරතිවුපත්තු හි රු.34,481,084 ක පිරිවැයකට ආශ්‍රිත සිවිල් වැඩ සමඟ ජල නල සැපයීම හා එළීම සඳහා ව්‍යාපෘතිය විසින් 2012 මාර්තු 21 දින කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) කොන්ත්‍රාත් ගිවිසුම අනුව කොන්ත්‍රාත් ගිවිසුම දිනයේ සිට දින 165 ක් ඇතුළත වැඩ නිම කළ යුතු විය. කෙසේ වුවද දින 593 ක් ඉකුත්ව ගොස් තිබියදීත් කොන්ත්‍රාත්කරු විසින් වැඩ ප්‍රමාණයෙන් සියයට 80 ක් පමණක් නිම කර තිබුණි. එබැවින් 2014 ජනවාරි 26 දින සිට බල පැවැත්වෙන පරිදි ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්තුව නවතා දමා තිබුණි. අවශ්‍ය ධාරිතාවය සමඟ කොන්ත්‍රාත්කරුගේ තාක්ෂණික හා මූල්‍යමය ධාරිතාවයන් ආරම්භක පියවරේදී ඇගයීම් කර නොතිබුණු බව නිරික්ෂණය විය. කෙසේ වුවද රු.1,724,052 ක් වටිනාකම වූ කාර්ය සාධන බැඳුම්කරය මුදාහැර නොතිබුණි.

(ii) ඉතිරි වැඩ ප්‍රමාණය රු.7,747,809 කට නව කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණද විස්තරාත්මක වැඩ සැලැස්ම හා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

**(ආ) සිවිල් වැඩ ඉදිකිරීම**

රු.27,000,015 ක පිරිවැයකට ජල කුළුණු, ළිං හෑරීම, පොම්පාගාර ආදී සිවිල් වැඩ සහ මඩකලපුව දිස්ත්‍රික්කයේ කොක්කඩිචෝලෙයි හා පොරතිවුපත්තුහි කාර්යාල ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා 2012 මැයි 10 දින කොන්ත්‍රාත්කරුවකු සමඟ ව්‍යාපෘතිය විසින් ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණ කරනු ලැබේ.

(i) සිවිල් වැඩ පිළිබඳ කොන්ත්‍රාත්කරුගේ පූර්ව පළපුරුද්ද හා මූල්‍ය ධාරිතාවය විධිමත්ව ඇගයීමෙන් තොරව ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබු අතර දින 458 ක් ඉකුත්ව ගොස් තිබියදීත් කොන්ත්‍රාත්කරු විසින් වැඩ ප්‍රමාණයෙන් සියයට 50 ක් පමණක් නිම කර තිබුණි. පසුව කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් රු.5,400,000 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් හා රු.9,181,117 ක් වූ අතුරු ගෙවීම් කිරීමෙන් පසුව ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්තුව නවතා දමා තිබුණි.

(ii) වෙනත් කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට පිළිවෙලින් රු.26,562,708 කට හා රු.11,384,676 කට කොන්ත්‍රාත් දෙකක් පිරිනැමීම මඟින් ඉතිරි වැඩ සම්පූර්ණ කර ගෙන තිබුණි. ඒ අනුව මෙම කාර්යය නිම කර ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.20,128,661 ක අතිරේක මුදලක් වැයකර තිබුණි.

(iii) රු.2,854,253 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් අදාළ ඇප බැඳුම්කරවලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 6.2.2 ඝන මීටර් 450 ක ප්‍රතිසාධිත කොන්ක්‍රීට් ජල කුළුණ ඉදිකිරීම

---------------------------------------------------------------------

ත්‍රිකුණාමලයේ පුල්මොඩෙයි නගරයේ ප්‍රතිසාධිත කොන්ක්‍රීට් ජල කුළුණක් ඉදිකිරීම සඳහා රු.25,203,192 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව, ජල කුළුණ ඉදිකිරීම දින 330 ක් ඇතුළත 2013 පෙබරවාරි වන විට සම්පූර්ණ කළ යුතු විය. කෙසේ වුවද ඉදිකිරීම් වැඩ 2014 මැයි 28 විගණන පරීක්ෂණ දිනය වන විටත් නිම කර නොතිබුණි.

(ආ) ජල කුළුණේ අත්තිවාරම් තට්ටුවේ ස්ථාන 6 ක ජලය කාන්දුවීම් තිබූ බව වාර්තා වී තිබුණි. කෙසේ වුවද එම කාන්දුවීම් සඳහා හේතු උපදේශක විසින් වාර්තා කර නොතිබූ අතර, ඒ අනුව උපදේශක විසින් එම කාර්යයන් විධිමත්ව අධීක්ෂණය කර නියාමනය කර නොතිබූ බව පෙන්නුම් කෙරේ.

(ඇ) කොන්ත්‍රාත්කරු විසින් වෙනත් පුද්ගලික සමාගමකට උප කොන්ත්‍රාත්තුවක් පිරිනැමීම මගින් ජල කාන්දුවීම් නිවැරදි කර ගෙන තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. ඉදිරියේදී ජල කුළුණේ වෙනත් ස්ථානවලින් ජල කාන්දුවීම් පැන නැගීමට ඇති හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක.